කොවිඩ්-19 වසංගතයේ තවත් රැල්ලකට ශ්‍රී ලංකාවේ අපි මේ වනවිට මුහුණ දී සිටිමු. එහිදී වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා වගකිව යුතු අංශ මගින් පනවා ඇති රෙගුලාසි සහ නීති රීති වලට අනුකූල වීම සෑම පුරවැසියෙකුගේම වගකීමක් වෙයි. එසේම ඒ පිළිබඳව සමාජය දැනුවත් කිරීම, එම රෙගුලාසි හා නීති රීති ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අංශයන්ට සහයෝගය දීම මාධ්‍යයන්ගේ වගකීමක්ද වේ. කෙසේ වෙතත් එහිදී උපරිම ආචාර ධාර්මිකත්වයක් පවත්වා ගැනීමද එලෙසින්ම මාධ්‍ය වගකීමක් වේ. අද දෙරණ සහ හිරු රාත්‍රී ප්‍රධාන පුවත් විකාශයන් තුළ දක්නට ලැබුණු කරුණක් වූයේ, මාධ්‍යවේදීන් විසින් පොදු ස්ථානයන්හි නිවැරදිව සෞඛ්‍ය නීති රෙගුලාසි වලට අනුකූල නොවන්නන් කැමරාවට හසුකරගනිමින්, ඔවුන්ගෙන් ඒ පිළිබඳව ප්‍රශ්න කරනා ආකාරයයි. එහිදී එම සෞඛ්‍ය නීති රෙගුලාසි කඩකරන්නන්ගේ අනන්‍යතාවය සැඟවීමේ කිසිදු උත්සාහයක්ද දක්නට නොලැබුණි.
ස්වර්ණවාහිනී පුවත් විකාශය තුළ මහජනතාව නිවැරදිව සෞඛ්‍ය නීති රෙගුලාසි වලට අනුකූල නොවීමේ ගැටළුව සාකච්ඡා කරන අතරවාරයේදී, යම් යම් පුද්ගලයින්ගේ අනන්‍යතාවය හෙළිදරවු වන සමීප ඡායාරූප දක්වා තිබෙනුද මෙලෙසින්ම නිරීක්ෂණය කිරීමට හැකි විණි.
මෙම වසංගතය තවදුරටත් ව්‍යාප්ත වීම හැකිතාක් අවම කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් මාධ්‍ය අත ඇති වගකීම පිළිගත යුතුයි. එනමුත් මෙහිදී අප ඇසිය යුතු පැනය වන්නේ, මෙවැනි 'මාධ්‍ය මෙහෙයුම්' සඳහා වගකීම සහ නිසි බලය මාධ්‍ය විසින් අත්පත් කොටගෙන කටයුතු කිරීම යෝග්‍ය වන්නේද යන්නයි. එසේම ඒ ඔස්සේ පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය උල්ලංඝනය කිරීම සහ පුද්ගල ගරුත්වය ආරක්ෂා නොකිරීම සාධාරණීකරණය කළ හැකිද යන්නයි. පුද්ගල ගරුත්වය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් මෙම ගැටළුව සාකච්ඡා කිරීමට මෙම මාධ්‍යයන්ට නොහැකිද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #sinhalanews #channel #TVNews #TVDerana #HiruNews